**ක්‍රීඩා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ**
**දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2011 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වු දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තා

## I - කොටස

**ක්‍රීඩා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශිර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව |

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 2,238,639,602 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 2,035,910,288 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් රු.17,576,959 ත් රු. 184,697,355 ත් අතර පරාසයක ප්‍රමාණයන්ගෙන් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.10 ත් සියයට 13.17 ත් අතර පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශිර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන | පුනරාවර්ත න | මුලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **136** | ක්‍රීඩා අමාත්‍යාංශය | 332,235,000 | 504,949,602 | 316,607,628 | 502,545,015 | 15,627,372 | 1,949,587 |
| **219** | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 266,505,000 | 1,134,950,000 | 246,332,047 | 970,425,598 | 20,172,953 | 164,524,402 |
| | **එකතුව** | 598,740,000 | 1,639,899,602 | 562,939,675 | 1,472,970,613 | 35,800,325 | 166,473,989 |

2.2 **අත්තිකාරම් ගිණුම්**

2.2.1 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

(අ) **ගිණුම් ඉදිරිපත් කිරීම**

ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම 2012 මාර්තු 31දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2012 අප්‍රේල් 25 දින එනම් දින 25 ක් ප්‍රමාද කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) **සීමා පිළපැදීම**

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිළපැද තිබුණ.

2.3 **පොදු තැන්පත් ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා දෙපාර්තමේනතුවේ පොදු තැන්පත් ගිණුම් ශේෂයන්හි එකතුව රු. 97,264,235 ක් වූ අතර අමාත්‍යාංශය පමණක් ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විසර්ජන ශීර්ෂය | කාල විශ්ලේෂණය | | | 2011 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 5 ට අඩු | |
| | | රු. | රු. | රු. | රු. |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 136 | 919,540 | 5,727 | 12,303 | 937,570 |
| එකතුව | | 919,540 | 5,727 | 12,303 | 937,570 |

## II - කොටස

**එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තාව**

1. **විසර්ජන ශිර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය**

1.1 **විගණන විෂය පථය**

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 දෙසැම්බර් 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ

ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය**

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.6 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(i) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 802 | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 18 දිනැති අංක අයි.ඒ.අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |

(ii) 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනත අනුව සියළුම ක්‍රීඩා සංගම් විසින් වාර්ෂික ගිණුම් ප්‍රකාශ විගණනය සඳහා විගණකාධිපතිවරයා විසින් පත්කරනු ලබන සුදුසුකම් ලත් විගණන සමාගමක් වෙත ඉදිරිපත් කර ඊළග වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත එදිරිපත් කළ යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රීඩා සංගම් විසින් පහත පරිදි ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි.

| වර්ෂය | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2009 | 06 |
| 2010 | 07 |
| 2011 | 11 |

(ආ) **අයවැය විචලනය**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) ශීර්ෂ 136 යටතේ වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු. 680,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු. 12,189,619 ක ඉතිරියක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 76 ත් සියයට 23 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) පුනරාවර්තන වැය විෂයයන් 03 කට වෙන් කරන ලද රු.2,700,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

වසර 02 කට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ පැවති රු. 12,303 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2011 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.71,484 ක් වූ අතර මෙය 2008 ජනවාරි 18 දින සේවයෙන් පහකරන ලද නිලධාරියෙකුට අදාළ ශේෂයක් විය. එම මුදල් අයකර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු. 14,204,446 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු. 14,379,944 ක් විය. මේ අනුව රු. 175,498 ක වෙනසක් පැවති අතර මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබිණි.

(iii) 1994 අගෝස්තු 18 දිනැති අංක 90 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 4 ජේදය ප්‍රකාරව ගිණුම සමඟ ඉදිරිපත් කළ යුතු කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය සමඟ සැසඳීමේ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

(iv) සාමාජික ණය ලේඛනය කාර්තුමය වශයෙන් තුලනය කර ශේෂය ඉදිරියට ගෙන යායුතු වුවත් සාමාජික ණය ලේඛනය (සී.සී.10) ශේෂ කර නොතිබුණි.

(v) භාණ්ඩාගාර මුද්‍රිත සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳීමට අදාළ සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර තිබුණද සැසඳීම සඳහා පිළියෙල කළ යුතු අත්තිකාරම් ගිණුම පිළිබඳ පාලන ගිණුම පිළියෙල කර නොතිබුණි.

1.4 **වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) අමාත්‍යාංශය විසින් 2011 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 1,994,498 ක් වූ අතර, එය වර්ෂ 01 කට අඩු ඒවා විය.

(ii) දුරකථන වියදම් සඳහා වූ බැරකම් රු. 53,301 කින් විසර්ජන ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | **මුදල් රෙගුලාසි** | | |
| | මු.රෙ. 103 | 389,111 | වාහන 04 කට සිදුව තිබුණු අනතුරු සම්බන්ධයෙන් රක්ෂණ වන්දි විස්තර පාඩු හා හානි ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. |
| | මු.රෙ. 1645 | - | අමාත්‍යාංශයට අයත් වාහන 19 කට අදාළ ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) | **චක්‍රලේඛ විධිවිධාන** | | |
| | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| | 2011 නොවැම්බර් 29 දිනැති අංක 220/2011 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | 226,535 | වාහන 05 කට සිදුව තිබූ අනතුරු විසර්ජන ගිණුම තුලින් හෙළිදරවු කර නොතිබුණි. |

## 1.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2011 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 10 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 33 | 25 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 25 | 25 | - |
| | එකතුව | 72 | 62 | 10 |

**2. විසර්ජන ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**2.1 විගණන විෂය පථය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.
සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 දෙසැම්බර් 15 දින දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ**

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 3.14 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 802 | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.මෙය පසුගිය වර්ෂවල වාර්තාවලින් ද පෙන්වා දී තිබුණි. |

| | | |
|---|---|---|
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පිළියෙල කර නොතිබුණි. |
| පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවරවත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිළියෙල කර නොතිබුණි. |
| පාලන වාර්තාව | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පාලන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

(ii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට පිළිතුරු 2012 දෙසැම්බර් 31 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.229,141,293 ක් විය.

(iii) නුවරඑළිය තුරඟ තරඟ පිටිය ආශ්‍රිත ක්‍රීඩා සංකීර්ණය නිර්මාණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය වෙනුවෙන් 2008, 2009, 2010 සහ 2011 වර්ෂයන් හිදී එකතුව රු. 179,569,597 ක් ගෙවා තිබුණු අතර කොන්ත්‍රාත් ගෙවීම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) ශීර්ෂ 219 යටතේ එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. 150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු.5,814,689 ක ඉතිරියවු අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 67 ත් සියයට 6 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඇ) සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණ.

**(ඈ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) 2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රු. 96,326,664 ක ශේෂයක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ii) මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම් ශේෂ භාණ්ඩාගාර පොත් සමඟ මාසිකව සසඳා වැරදි ඇතොත් ඒවා එම අවස්ථාවේදීම නිවැරදි කරවා ගතයුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් මාසිකව සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. ඒ අනුව වර්ෂ අවසාන භාණ්ඩාගාර මුද්‍රිත සටහන පදනම් කරගෙන විසර්ජන ගිණුම පිළියෙල කර තිබුණු බැව් නිරීක්ෂණය විය.

(iii) මුදල් රෙගුලාසි 565(3) ප්‍රකාරව ලෙජරයේ අවසාන පිටු කිහිපය වෙන්කරවාගෙන තුලන ගිණුමක් පිළියෙල කල යුතු වුවත් එම මාසක තුලන ගිණුම පිළියෙල කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කල යුතු මාසික තැන්පතු සාරාංශය පිළියෙල කර නොතිබුණි.

(v) මදල් රෙගලාසි 570 ප්‍රකාරව කල් ඉකුත් වූ සියළුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත් තැන්පත් පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා දෙපාර්තමේන්තුවේ කල් ඉකුත්වූ තැන්පත් ශේෂයන් පවතී ද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව අනියම් සහ දෛනික වැටුප් ලබන සේවකයන් හැර අනෙකුත් සියළුම කාර්‍ය මණ්ඩලය සඳහා වැටුප් ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත් එම ලේඛණය පවත්වාගෙන ගොස් නොතිබුණි. පරිගණකය ආශ්‍රයෙන් ලබාගන්නා ලද මාසික දත්ත පමණක් ඇතුලත් වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

(ii) දෙපාර්තමේන්තු නිලධාරිණියකගෙන් 2011 පෙබරවාරි 15 දිනට අයවිය යුතුව තිබුණු රු. 67,114 ක ආපදා ණය මුදලකට අදාළ ණය වාරික 2011 දෙසැම්බර් 31 දින දක්වාම අය කරගෙන නොතිබුණි.

(iii) 2011 දෙසැම්බර් 31 දිනට පැවති රු. 268,898 ක ණයහිමි ශේෂයට අදාළ නිලධාරීන් ස්ථාන මාරුවීම් ලබා දෙපාර්තමේන්තුවට පැමිණි දිනයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ශේෂ නිරවුල් කිරීමේ ප්‍රමාදයන් පවතී ද යන්න තහවුරු කර ගත නොහැකි විය.

**2.4 වත්කම් කළමනාකරණය**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 756 හා 2008 නොවැම්බර්19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 436 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලය සහ දිසත්‍රික් කාර්යාල 18 ක වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවද, 2010 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. 2011 වර්ෂය වෙනුවෙන් ද දිස්ත්‍රික් කාර්යාලය 04 ක සහ ප්‍රධාන කාර්යාලයේ අංශ 03 ක භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2011 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.102,157,632 ක් වු අතර එම බැරකම් වර්ෂයට අඩු කාලපරිච්ඡේදයකට අයත් විය.

## 2.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(i) මුදල් රෙගුලාසි** | | |
| (i) මු.රෙ. 94 | 736,755 | වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් පරිදි ඇත්නම් මිස කිසිදු වියදමකට හෝ බැදීමකට හෝ නොබැදිය යුතු වුවත් වැය විෂය අංක 219-2-2-1405 හි වියදම් දැරීමෙන් පසුව ඉතිරිය ඉක්මවූ බැරකම් බැදීම් ඇතිකරගෙන තිබුණි. |
| (ii) මු.රෙ. 735(2) | - | 219 වැනි පොදු ආකෘතිය අනුව භාණ්ඩ ලැබීම් පත්‍ර පිළියෙල කර නොතිබුණි. |
| **(ii) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| i 2011 අයවැය සකස් කිරීම පිළිබදමාර්ගෝපදේශ සංග්‍රහය | 2,057,694 | තථ්‍ය සේවක අවශ්‍යතාව අනුව පුද්ගල පඩිනඩි ගණනය කළයුතු වුවත් පුද්ගල පඩිනඩි පුරප්පාඩු සංඛ්‍යාවද පදනම් කරගෙන ගණනය කිරීම නිසා වැය විෂය 219-02-02-1001 හි මුදල් ඉතිරි වී තිබුණි. |
| ii 1994 ජූලි 12 දිනැති අංක 35/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3.3 ජේදය | 101,413,648 | බැරකම් සනාථ කරවා ගැනීම සඳහා අදාල ආයතනවලින් තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි. |

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති අතරමග නැවතීම සහ මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති පිළිබදව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### 2.6.1 ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර අතහැර දැමීම

**(අ) නුවර එළිය තුරඟ තරඟ පිටිය ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම**

2008 අගෝස්තු 04 වැනි දින කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව උක්ත කාර්යය සඳහා ව රු. 409,947,888 ක පිරිවැය ඇස්තමේන්තුවට 2008 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් සැලසුම් නිසි ලෙස ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2009 මාර්තු 06 දින ශ්‍රී

ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් එම ඇස්තමේන්තුව රු. 227,670,000 කට සංශෝධනය කර කර තිබුණි.

ඒ අනුව 2009 ඔක්තෝබර් 29 වැනි දින ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟද, 2008 මැයි 15 වැනි දින අධීක්ෂණ කටයුතු සඳහා උපදේශන සේවා ගිවිසුම නාගරික සංවර්ධන අධිකාරිය සමඟද අත්සන්කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2008, 2009 සහ 2010 යන වර්ෂයන් හි දී පිළිවෙලින් රු. 51,603,870 ක්, රු. 49,201,382 ක් සහ රු.78,762,350 ක් වශයෙන් එකතුව රු. 179,567,602 ක වියදමක් දරා තිබුණි. එහෙත් මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පාරිසරික අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු වහාම අත්හිටුවන ලෙසට මධ්‍යම පරිසර අධිකාරියේ අංක 08/EIA/03/2009 හා 2009 නොවැම්බර් 03 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) වෙත දන්වා තිබුණු අතර 2010 අගෝස්තු 26 දින සිට එහි ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි.

**(ආ) ටොරින්ටන් ක්‍රීඩා පිටියේ කෘතිම ධාවන පථය ඉදිකිරීම**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) ටොරින්ටන් ක්‍රීඩා පිටියේ කෘතිම ධාවන පථය ඉදි කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යවරයා විසින් 2009 ජූනි 05 දිනැතිව ඉදිරිපත් කරතිබුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් මෙම ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත්තුව රු. 220,000,000 ක ඇස්තමේන්තු ගත මුදලකට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පැවරීමට 2009 ජූනි 17 දින අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2009 අගෝස්තු 04 දිනැති අංක:ක්‍රී.සං./සං3/1/165 දරන ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා තිබුණි. එහෙත් ඉහත ඇස්තමේන්තුව රු. 278,913,624 ක ලෙස නැවත සංශෝධනය කර 2009 සැප්තැම්බර් 30 දින ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව ව්‍යාපෘතියට අවශ්‍ය අමතර ප්‍රතිපාදන 2010 වර්ෂයේ දී ලබාදීමේ කොන්දේසිය යටතේ සංශෝධිත ඇස්තමේන්තුවට අනුමැතිය 2009 ඔක්තෝබර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී තිබුණු අතර ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් 2009 නොවැම්බර් 25 දිනැති අංක ක්‍රීසංදෙ/සං/3/7/2 දරන ලිපිය මගින් සංශෝධිත මුදලට නැවතත් මෙම කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා තිබුණි. ඉන් අනතුරුව 2009 දෙසැම්බර් 17 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ක්‍රීඩා අමාත්‍යාංශය අතර මෙම කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුමට එළඹී තිබුණ අතර ගිවිසුම අනුව 2010 ජූලි 12 දින කොන්ත්‍රාත්තුව නිම කිරීමට නියමිතව තිබුණ ද, එදින තෙක් කිසිදු ඉදි කිරීම් කාර්යයක් ආරම්භ කර නොතිබුණි.

(ii) 2009 දෙසැම්බර් 02 දින දක්වා සපයන ලද සේවා සහ උපදේශක ගාස්තු ඇතුළත් කරමින් 2009 දෙසැම්බර් 21 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් පළමු අන්තර් ගෙවීම් බිල්පත මගින් රු.163,602,458 ක් ඉල්ලා තිබුණි. ඒ අනුව සැලසුම් හා නිර්මාණ ගාස්තු වලින් සියයට 20 ක් ද ඇතුළත්ව වැට් බදු සහිතව රු.78,978,410 ක අත්තිකාරම් මුදලක් ගෙවීම ක්‍රීඩා අමාත්‍යාංශ ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර තිබුණද 2009 දෙසැම්බර් 31 දින අංක 5869 වවුචරය මගින් රු. 10,000,000 ක අත්තිකාරම් මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවා තිබුණි. එහෙත් විගණන පරීක්ෂණ දිනය වූ 2011 නොවැම්බර් මාසය දක්වාත් ඉදිකිරීම් කටයුතු කිසිවක් ආරම්භ කර නොතිබුණු අතර, කොනත්‍රාත්තුව ආරම්භ කිරීම, අවලංගු කිරීම හෝ ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම සඳහා ක්‍රියා කළ බවට සාක්ෂි නොවීය.

(iii) මෙම ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.4,166,849 ක් වැය කර තිබුණු අතර මෙම මුදල ඉහත ii ඡේදය පරිදි රාජ්‍ය ඉංජිනේරු සංසථාව වෙත ගෙවා තිබුණු රු. 10,000,000 ක මුදලින් ප්‍රතිපූරණය කර ගෙන තිබුණ අතර තවදුරටත් රු. 5,813,151 ක් ක්‍රීඩා අමාත්‍යාංශයට අයවිය යුතුව තිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

(vi) මෙම ඉදිකිරීම් කාර්යය සඳහා 2010 වර්ෂයේ දී රු. 100,000,000 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබුණ ද අදාළ කාර්යය සඳහා යොදවා නොතිබුණු අතර ඉන් රු. 93,200,000 ක් වෙනත් වැය විෂයයන් 04 කට මාරු කර තිබුණි. වර්ෂ අවසානයට වැය විෂයයෙහි තවදුරටත් රු. 6,800,000 ක මුදලක් ඉතිරිවී තිබුණි.

**2.7 කාර්යසාධනය**

**(අ) ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම හා බෙදා හැරීම**

219-2-2-2103 මූලධන වැය විෂයය යටතේ 2011 වර්ෂය සඳහා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට රු.20,000,000 ක ප්‍රතිපාදන අනුමතවී තිබුණු අතර, ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් 2011 වර්ෂය තුලදී රු.6,292,452 ක් වැය කර තිබුණ. මේ සම්බනධයෙන් පහත කරුනු නිරීක්ෂණය විය.

(i) ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට අදාලව වාර්ෂික අවශ්‍යතාවය හදුනාගෙන නොතිබුණු අතර අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ii) ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පසුගිය වර්ෂයෙ වියදමට සාපේක්ෂව ඉල්ලීම් කර තිබුණි.

(iii) මෙම ප්‍රතිපාදන වැය කිරීම සඳහා සැලැස්මක නොතිබුණු අතර අවස්ථානුකූලව ඇතිවන ඉල්ලීම් සඳහා මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(iv) 2011 ඔක්තෝබර් මස 22 දිනට එම ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණේ රු.7,052,894 ක් එනම් සියයට 35.26 ක් පමණි.

**(ආ) භාණ්ඩ නිකුත් කිරීම**

ක්‍රීඩා සමාජ, ක්‍රීඩා සංගම් හා වෙනත් බාහිර පාර්ශවයන් වෙත නිකුත් කිරීම් පරික්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) සෑම වර්ෂයක් පාසාම ඉතා ඉහළ වටිනාකමක් ඇති ක්‍රීඩා භාණ්ඩ බෙදා දී තිබුණ ද, ක්‍රීඩා භාණ්ඩ බෙදාහැරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස්කර නොතිබීම.

(ii) ප්‍රමුඛතා ලේඛන පිළියෙල කර අනුමත කිරීමකින් තොරව පාසැල්, වෙනත් රාජ්‍ය ආයතන, දේශපාලන නියෝජිතයින් සහ නිලධාරින්ගේ ඉල්ලීම් මත බෙදාහැරීම් සිදුකර තිබීම.

(iii) 2011 වසර සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදාහැරීමේදී විවිධ බාහිර පාර්ශවයන්ගේ මැදිහත් වීමෙන් හා ඔවුන්ගේ අවශ්‍යතා මත ක්‍රීඩා සංගම් සහ වෙනත් පාර්ශවයන් වෙත ක්‍රීඩා භාණ්ඩ බෙදාහැරීම සිදුකරන බව නිරීක්ෂණය වූ අතර දෙපාර්තමේන්තුවේ සෘජු මැදිහත් වීමෙන් භාණ්ඩ බෙදා දීම ඉතා අවම මට්ටමක පැවැතීම.

(iv) අවශ්‍යතාවය පිළිබඳ කරන ලද ලිඛිත ඉල්ලීමක් භාණ්ඩ නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අවස්ථා පැවැතීම.

(v) ක්‍රීඩාභාණ්ඩ නිකුත් කිරීමේදී, භාණ්ඩ තොග ලේඛනයට ඇතුළත් නොකිරීම, නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා නොගැනීම, භාණ්ඩ භාරගත් බවට අදාළ පාර්ශවය විසින් අත්සන් නොයෙදීම සහ නිකුත් කිරීම් අදාළ භාණ්ඩය යටතේ සටහන් නොකර වෙනත් භාණ්ඩයක් යටතේ සටහන් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය වීම.

(vi) එක් එක් පාර්ශවයන් වෙත හෝ ක්‍රීඩා සංගමයන් වෙත එක් වරකට නිකුත් කළයුතු හා නිකුත් කළ හැකි උපරිම භාණ්ඩ ප්‍රමාණය පිළිබඳ තීරණයක් ගෙන නොතිබීම හේතුවෙන් විවිධ පාර්ශවයන් වෙත විවිධ ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ නිකුත් කර තිබීම. එ හේතුවෙන් භාණ්ඩ නිකත් කිරීමේ ක්‍රියාවලියේ හා ඒ පිළිබඳ ගිණුම් තැබීම සම්බන්ධ ක්‍රියාවලියේ වංචා හා වැරදි ඇතිවීමේ හැකියාව බැහැර කළ නොහැකි බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

**(ඇ) තොග ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම**

භාණ්ඩ ලැබීම් සහ නිකුත් කිරීම් පිළිබඳ විස්තර තොග ලේඛනයෙ සටහන් තැබීමේදී ලැබීම් හා නිකුත් කිරීම් ප්‍රමාණයන් නිවැරදිව සහ ලද දිනය හා නිකුත් කළ දිනය නිවැරදිව හා අනුපිළිවෙලට සටහන් කර නොතිබුණි. මේ අනුව තොග ශේෂය සාවද්‍ය තත්ත්වයක් නිරූපණය කෙරෙන බවද නිරීක්ෂණය විය.

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලැපුම් කළ යුතු ශේෂ**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණු අතර අවසන් වරට 2011 සැප්තැම්බර් සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණි. එමනිසා 2011 දෙසැම්බර් 31 දිනට ගැලැපුම් කළ යුතු ශේෂ හඳුනාගත නොහැකි විය.

(ආ) සැප්තැම්බර් මාසයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් 120 ක වටිනාකම රු. 978,075 ක් විය. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, මුදල් පොතේ සටහන් නොවන, බැංකුව විසින් කරන ලද ගෙවීම්වල වටිනාකම රු. 3,475,824 ක් විය. එම ගෙවීම් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි.

**2.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 06 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 190 | 133 | 57 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 48 | 41 | 07 |
| | එකතුව | 253 | 181 | 72 |

කාර්යාල කාර්ය සහායක සේවයේ අනුමත සේවක සංඛ්‍යාව 12 දෙනෙකු වන අතර සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 30 දෙනෙකි. ක්‍රීඩා පිටි සහායක අනුමත සේවක සංඛ්‍යාව 25 දෙනෙකු වන අතර කිසිදු සේවකයෙකු බඳවාගෙන නොතිබුණි. ඒ අනුව කාර්යාල කාර්ය සහායකයින් 18 දෙනෙකුගේ අතිරික්තයක් සහ ක්‍රීඩා පිටි සහායකයන් 25 දෙනෙකුගේ පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බව නිරීක්ෂණය විය.

**2.10 අභ්‍යන්තර පාලනය**

**අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් නොවූ අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනයක් සිදු කර තිබුණි.

**3. ක්‍රීඩා සංගම්**

**3.1 ශ්‍රී ලංකා වූෂු සම්මේලනය - 2008**

2006 වර්ෂයේ දී චීන රජයෙන් පරිත්‍යාග ලෙස ලබා දී තිබූ ක්‍රීඩා භාණ්ඩ නිශ්කාෂණය (clearing ) වෙනුවෙන් ගෙවා තිබූ රු. 889,508 ක නිශ්කාෂණ ගාස්තු, වත්කම් වශයෙන් දක්වා තිබුණ ද අදාල ක්‍රීඩා භාණ්ඩ තොගයන් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. තවද ස්ථාවර වත්කම් ලේඛනයක් සහ ඉන්වෙන්ට්‍රි ලේඛනයක් ද පවත්වාගෙන ගොස් නොතිබුණි.

**3.2 ශ්‍රී ලංකා කැරම් සම්මේලනය**

**3.2.1 ගිණුම් වර්ෂය - 2008**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තරඟාවලි, වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා දින දර්ශනයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) වියදම් සඳහා ඇස්තමේන්තු පිලියෙල කිරීමකින් තොරව තරඟාවලි සඳහා අත්තිකාරම් ලබාගෙන වියදම් දරා තිබුණි.

(ඇ) වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව, ජාත්‍යන්තර තරඟාවලි 03 ක් සඳහා රු. 3,422,580 ක් වැය කර තිබුණි.

### 3.2.2 ගිණුම් වර්ෂය 2009

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සින්කෝ කැරම් බෝඩ් ආයතනයෙ, වෙළඳ දැන්වීමක් පල කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා කැරම් සම්මේලනයට ලැබිය යුතු රු. 42,000 ක් ගිණුම්වලට ගෙන නෙතිබුණි.

(ආ) විධායක කමිටුවේ අනුමතියකින් තොරව 13 වන සාර්ක් තරඟාවලියට සහ 3 වන ආසියාතික කැරම් තරඟාවලියට සහභාගි වූ නිලධාරීන් හා ක්‍රීඩකයන් ඉන්දියාවේ ගත කරන ලද අතිරේක දිනයක් වෙනුවෙන් රු. 22,653 ක අමතර වියදමක් දරා තිබුණි.

(ඇ) වගකිව යුතු නිලධාරියෙකු විසින් සුළු මුදල් ශේෂය දෛනිකව පරීක්ෂා කර නොතිබුණු අතර සුළු මුදල් වවුචර ද අනුමත කර නොතිබුණි. තවද අනුමත රු. 10,000 ක සුළු මුදල් අග්‍රිමය ඉක්මවා 2009 මාර්තු මාසයේදී රු. 8,206 ක් වැය කර තිබුණි.

(ඉ) සම්මේලනය විසින් 2009 වර්ෂය වෙනුවෙන් සමස්ථ අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) තරඟවලි සඳහා වෙන් වෙන්ව ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද ඒවා සඳහා විධායක කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(උ) පුහුණු තරඟ සහ විදේශීය තරඟ සඳහා ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ඌ) භාවිතයට ගත නොහැකි වටිනාකම රු. 36,525 ක් වු කැරම් නීතිරීති පොත් 730 ක් සහ ලියාභල අගය රු. 23,731 ක් වූ ඔරලෝසු තොගයක් ගබඩා කර තිබුණි.

(එ) මුදල් භාර ගැනීම, මුදල් බංකුගත කිරීම,චෙක්පත් ලිවීම,ගෙවීම් කිරීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම,සුළු මුදල් පාලනය, ගිණුම් පොත්පත් පවත්වාගෙන යැම සහ අවසන් ගිණුම් පිළියෙල කිරීම එකම නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි.

### 3.3 ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය - 2009

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2004 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ශුද්ධ අගය රු. 418,303 ක් ව දේපල, පිරියත හා උපකරණ 2005 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වලින් අතහැර තිබුණි.

(ඇ) ඔලිම්පික් සොලිඩැරිටි පාඨමාලාව සඳහා සභාපතිවරයා විසින් දරන ලද රු. 382,000 ක මුදලන් රු. 250,000 ක මුදලක් 2009 දෙසැම්බර් 31 දින වන විට සභාපතිවරයාට ප්‍රතිපූරනය කර තිබුණු අතර, සභාපතවරයාට තව දුරටත් ගෙවිය යුතු ශේෂය රු. 132,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 215,970 ක් ලෙස දක්වා තිබුණි. තවද වියදම් වලට අදාල බිල්පත්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) පහත සඳහන් අයිතමයන්ට අදාලව ඊට ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| අයිතමය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඔලිම්පික් කමිටුවෙන් ලද ප්‍රදාන | 250,000 | ලදුපත සහ ආවරණ ලිපිය |
| ලංකා බැංකු ශේෂය | 30,186 | ශේෂ සනාථ කිරීම් |
| හැටන් නැෂනල් බැංකු ශේෂය | 6,785 | ශේෂ සනාථ කිරීම් හා 2008 වර්ෂය සඳහා බැංකු ප්‍රකාශ |
| එකතුව | **286,971** | |

3.4 **ශ්‍රී ලංකා ටෙනිස් සංගමය**

3.4.1 **ගිණුම් වර්ෂය 2010**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(අ) සංගමය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් අවුරුදු 25 ක කාලයක් සඳහා කල් බදු යටතේ ලබාගත් ඉඩමක ශ්‍රී ලංකා කැරම් සංගමය පවත්වාගෙන ගොස් තිබුණු අතර අදාල බදු ගිවිසුම 2008 සැප්තැම්බර් 30 දිනෙන් අවසනව තිබුණ ද එය අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 11,477,500 ක් වූ කල් බදු කුලිය වෙනුවෙන් වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

(ඈ) සේවක පාර්තෝෂිත සඳහා වෙන් කරන ලද රු. 1,183,922 ක් ආයෝජනය කර නොතිබුණි.

3.4.2 **ගිණුම් වර්ෂය** 2011

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) සංගමය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ii) සංගමය විසින් 1985 ජුනි 01 සිට 2011 සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන්, කොළඹ මහ නගර සභාවට ගෙවිය යුතු රු. 14,028,700 ක කල් බදු කුලි වෙනුවෙන් වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශන වල සලසා නොතිබුණි.

(iii) සංගමය විසින් 1958 දී අවුරුදු 25 ක් සඳහා කල් බදු පදනම මත රජයෙන් ලබාගෙන තිබු ඉඩමට අදාල කල් බදු ගිවිසුම 1983 සැප්තැම්බර් 30 දිනෙන් අවසන්ව තිබුණ ද අදාල ගිවිසුම අළුත් කිරීමට කටයුතු කර ෙ නාතිබුණි.

3.5 **ශ්‍රී ලංකා පැසිපන්දු සංගමය - 2010**

එකතුව රු. 1,261,840 ක් වූ වියදම් අයිතමයන් 05 කට අදාල උපයෝගී ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවිය.

**3.6 ශ්‍රී ලංකා සැහැල්ලු පනදු සංගමය - 2010**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

(ආ) බැංකු ශේෂය තහවුරු කර ගැනීම සඳහා සෘජු ශේෂ සනාථනයන් බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි.

**3.7 ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය -2010**

ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

**3.8 ආධුනික රුවල් ඔරු සංගමය -** 2011

පහත කරුණු නිරීකෂණය කෙරේ.

(අ) සංගමයට අයිති රුවල් ඔරු 16 ක් සහ හබල් 103 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට රු. 17,214 ක මුදල් ශේෂයක් නිශ්කාර්යව පැවතුණි.

**3.9 ශ්‍රී ලංකා අශ්වා රෝහක සංගමය -** 2011

පහත කරුණු නිරීකෂණය කෙරේ.

(i) ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ii) වර්ෂයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි

(iii) සංගමය විසින් ගෙවීම් වවුචර් වෙනුවට බිල්පත් සහ ඉන්වොයිස් මත ගෙවීම් කර තිබුණි.

(iv) ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි.

(v) අශ්වයින් 18 දෙනෙකු ආනයනය කිරීම සඳහා රු. 2,984,040 ක මුදලක් වැය කර තිබුණ ද අශ්වයන් දෙදෙනෙකු නුසුදුසු තත්ත්වයේ සිටීම සහ අශ්වයන් දෙදෙනෙකු ඉන්දියාවේදී මියයැම මත අශවයන් 4 දෙනෙකු අහිමි වීම හේතුවෙන් සංගමයට රු. 663,120 ක අලාභයක් සිදුවී තිබුණි. තවද අශ්වයින් ආනයනය කිරීමේදී රේගු ගාස්තු, නිශ්කාෂණ, ප්‍රවාහන වියදම් සහ නිරෝධායන වියදම් වෙනුවෙන් දරන ලද රු.2,797,647 ක මුදල ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැයට ඇතුලත් නොකර පරිපාලන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(vi) 2011 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(vii) 2011 වර්ෂයේ දී මිලදී ගන්නා ලද පරිගණකයක් සොරකම් කර තිබුණු අතර එයින් ආයතනයට රු. 111,800 ක අලාභයක් සිදුවී තිබුණි.

**3.10 ශ්‍රී ලංකා හොකී සංගමය -** 2011

සංගමය වෙත ජාතික ඔලිම්පික් කමිටුව වෙතින් 2010 මැයි 10 දින ලැබී තිබුණ රු. 149,300 ක චෙක්පත ගිණුම් වලට නොගෙන සංගමයේ ලේකම්වරයා විසින් ලබාගෙන තිබුණි.

## 3.11 කරාටේ දෝ සංගමය - 2011

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) 2011 වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ii) 2011 වර්ෂයට අදාලව බැංකු සැසදුම් පිළියෙල කර නොතිබුණි. තවද චෙක්පත් සහ මුදලින් කරන ලද ගෙවීම් මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(iii) පහත සඳහන් වියදම් වලට අදාල උපයෝගී ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| අයිතමය | වටිනාකම රු. |
|---|---|
| ලෝක කුසලාන මැලේසියානු තයභාවලිය | 100,000 |
| 2011 ඔක්තෝබර් මාසික දීමනා | 12,000 |
| Preparation of sketch of Competition | 5,000 |
| ආහාර වියදම් | 35,000 |
| **එකතුව** | **152,000** |

(iv) 2011 ජනවාරි 01 දිනට වත්කම් සහ වගකීම් වල ආරම්භක ශේෂයන් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(v) රු. 288,159 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(vi) ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල මාසික දීමනා රු. 18,000 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(vii) තරඟාවලි ආදායම් රු. 27,500 ක් සහ සාමාජික මුදල් රු. 2,000 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

## 3.12 ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය - 2011

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) ගල්කිස්ස, ශ්‍රී ධර්මපාල මාවත, අංක: 21/21 හි සහ ගල්කිස්ස, සිරිපාල මාවත, අංක: 38 හි පිහිටි ඉඩම් හා ගොඩනැගිලි 02 ක් සංගමය සතුව ඇති අතර ඒවායෙහි පිරිවැය වටිනාකම රු. 17,266 ක් බැව් අවසන් ගිණුම් වල දක්වා තිබණි. මෙම අගය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) රු. 561,866 ක් වූ බැංකු ශෙෂය සම්බණ්ධයෙන් සෘජු ශේෂ සනාතනයන් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

## 3.13 ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමය - 2011

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ

(i) ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත් ලෙස නඩත්තු කර නොතිබුණි.

(ii) වර්ෂ තුනකට වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 496,030 ක වෙළඳ ණය ගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කිරීම් කර නොතිබුණි.

(iii) පහත සඳහන් අයිතමයන්ට අදාලව ඊට ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| අයිතමය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| තොග | 132,584 | සමීක්ෂන වාර්තා සහ තොග ලේඛන |
| ණය ගැතියෝ | 496,030 | සනාථනයන් සහ වයස් විශ්ලේෂණය |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 434,289 | ශේෂ සනාථනයන් |
| ණය හිමියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ | 1,015,093 | සනාථනයන් සහ වයස් විශ්ලේෂණය |

(iv) මිලි මීටර් 55 පිස්තෝල (free pistols) 02 ක් සහ ප්‍රොටිමර්ස් (protimers) 04 ක් භෞතික පරීක්ෂාව සඳහා විගණනයට ඉදිරිපත් නොවීය.

## 3.14 ශ්‍රී ලංකා බිලියඩ් සහ ස්නූකර් සංගමය - 2011

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(i) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

(ii) සමස්ථ සාමාජික ලේඛනය සහ සාමාජිකයන් විසින් කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(iii) 2011 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.